# කලහ විවාද සූත්‍ර 1
## Quarrels & Disputes 1

My immense gratitude to the great Noble council of Akanitta brahma realm

01/02/2014


**පියප්පහූතා කලහා විවාදා, පරිදෙවසොකා සහමච්ඡරා ච;**
**මානාතිමානා සහපෙසුණා ච, මච්ඡෙරයුත්තා කලහා විවාදා;**
**විවාදජාතෙසු ච පෙසුණානි.**

කලහයෝ ද විවාදයෝ ද පරිදේව - ශෝකයෝ ද මාත්සර්‍ය්‍යයෝ ද මානාතිමානයෝ ද පෛශුන්‍යයෝ ද ප්‍රියවස්තුහු කෙරෙන් උපන්නාහුය. කලහයෝ ද විවාදයෝ ද (පරිදේව - ශෝක - මාන - අතිමාන - පෛශුන්‍යයෝ ද) මාත්සර්‍ය්‍යයෙහි යෙදුණාහු වෙති. විවාද උපන් කල්හි පිසුනු වචනයෝ වෙත්.

**පියප්පහූතා කලහා විවාදා, පරිදෙවසොකා සහමච්ඡරා ච;**

ප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ ද සංස්කාරයෝ දැයි. කවර සත්ත්වයෝ ප්‍රියයෝ ද යත්? මෙලොවැ මවු හෝ පියා හෝ බෑයා හෝ බූනැණිය හෝ පුතා හෝ දූ හෝ මිතුරෝ හෝ යහළුවෝ හෝ නෑයෝ හෝ ඔහුට වැඩ කැමැති වූ හිත කැමැති වූ සුව කැමැති වූ යෝගක්ෂෙමය කැමැති වූ යම් කෙනෙක් වෙත් ද මේ සත්ත්වයෝ ප්‍රියයෝ වෙත්. කවර සංස්කාරයෝ ප්‍රියයෝ ද යත්? මනවඩන රූපයෝ මනවඩන ශබ්දයෝ මනවඩන ගන්ධයෝ මනවඩන රසයෝ මනවඩන ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ, මේ සංස්කාරයෝ ප්‍රිය වෙත්.


ප්‍රියවස්තුව 'අසිද ගනිතී' සැක ඇත්තාහු ද කලහ කෙරෙති, අසිඳුනා කල්හි දු කලහ කෙරෙති, අසිඳගත් කල්හි දු කලහ කෙරෙති, ප්‍රියවස්තුව 'පෙරළෙතී' සැක ඇත්තාහු ද - පෙරළෙන කල්හි දු පෙරළුණු කල්හි දු කලහ කෙරෙති, ප්‍රියවස්තුව 'අසිද ගනිතී' සැක ඇත්තාහු ද විවාද කෙරෙති, අසිඳුනා කල්හි දු - අසිඳගත් කල්හි දු - ප්‍රියවස්තුව 'පෙරළෙතී' සැක ඇත්තාහු ද - පෙරළෙන කල්හි දු - පෙරළුණු කල්හි දු විවාද කෙරෙත්. ප්‍රියවස්තුව 'අසිද ගනිතී' සැක ඇත්තාහු ද පරිදෙවනා කෙරෙති, අසිඳුනා කල්හි දු අසිඳගත් කල්හි දු - ප්‍රියවස්තුව 'පෙරළෙතී' සැක ඇත්තාහු ද - පෙරළෙන කල්හි දු - පෙරළුණු කල්හි දු පරිදෙවනා කෙරෙත්. ප්‍රියවස්තුව 'අසිද ගනිතී' සැක ඇත්තාහු ද ශෝක කෙරෙති, අසිඳ ගන්නා කල්හි දු - අසිඳගත් කල්හි දු - ප්‍රියවස්තුව 'පෙරළෙතී' සැක ඇත්තාහු ද - පෙරළෙන කල්හි දු - පෙරළුණු කල්හි දු ශෝක කෙරෙත්. ප්‍රියවස්තුව රකිති, ගොපනය කෙරෙති, අයත් කෙරෙති, මමායන කෙරෙති, මසුරු කෙරෙත්.




- සංකල්පය ප්‍රිය විය
- මනාප වූ රූප,ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සහ ධර්ම නිසා ඇතිවන ස්පර්ශය මෙනෙහි කරන්න.
- ඇස, කණ, නාසය, දිව, කය ස්පර්ශ වූ විට පමණක් ධර්මයෝ පහළ වෙත්ද?

**මානාතිමානා සහපෙසුනා ච** - ප්‍රියවස්තුව නිසා මානය උපදවති ප්‍රියවස්තුව නිසා අතිමානය උපදවත්. කිසෙයින් ප්‍රියවස්තුව නිසා මානය උපදවති ? යත්: 'අපි මනවඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් ලබන සුල්ලම්භ, එහෙත් මේ අන්‍යයෝ මනවඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් නො ලබන සුල්ලභ'යි මෙසේ ප්‍රියවස්තුව නිසා මානය උපදවත්. කෙසේ ප්‍රියවස්තුව නිසා අතිමානය උපදවති ? යත් 'අපි මනවඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් ලබන සුලල්ම්භ, මේ අන්‍යයෝ වැලිත් මනවඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් නො ලබන සුල්ලභ'යි මෙසේ ප්‍රියවස්තුව නිසා අතිමානය උපදවත්. **පෙසුණකං** - මෙහි එකෙක් පිසුනුබස් කියනුයේ වෙයි: මෙතැනින් අසා මොවුන්ගේ භේදය පිණිස එතැන කියන්නේ වෙයි ..මෙසේ බිඳුවන අදහස් ඇතියේ පිසුනුබස් එලවා කියා නුයි 'මානාතිමානා සහපෙසුනා ච' යනු වේ.

- නන්දි වීමෙන් පසුව ධම්මමච්ඡරිය හරහා මනාප වූ ධර්මයන් ඇති වන්නේය. මෙසේ වීමට සංකල්පය ඇතිවී තිබිය යුතුය.
- මේ සඳහා රූපය නිසා අවිද්‍යාවෙන් එක වටයක් කරකැවීම, පියවර 7 ක් සිදුවී තිබිය යුතුය.
- මේ වනවිට රූපයට අගයක් දී ඇති අතර ඒ නිසා මාන වීමද හට ගනී.
- මානය සමග පිසුනාවාච ඇතිවේ.
- පලාසය මගින් වැඩි අකුසලය අඩු අකුසලයෙන් වෙන් කරන බව අමතක නොකරන්න.




**මච්ඡරයුත්තා කලහා විවාදා** – කලහය ද විවාදය ද පරිදේවය ද ශෝකය ද මානය ද අතිමානය ද පෛශූන්‍යය ද යන සප්ත කෙලශයෝ මාත්සර්‍ය්‍යයෙහි යෙදුණාහු අතිශයින් යෙදුණාහු භාත්පසින් යෙදුණාහු වෙශෙසින් යෙදුණාහු නුයි 'මච්ඡරයුත්තා කලහා විවාදා'යනු වේ.

**විවාදජාතෙසු ච පෙසුනානි** – විවාදය උපන් කල්හි හටගත් කල්හි නිපන් කල්හි වෙශෙසින් නිපන් කල්හි පහළ වූ කල්හි පිසුනුබස් එළවා කියති: මෙතැනින් අසා මොවුන්ගේ භෙදය පිණිස එතැන කියති, එතැනින් හෝ අසා ඔවුන්ගේ භෙදය පිණිස මොවුන්ට කියති: මෙසේ සමඟ වූවන් හෝ බිඳින්නාහු භෙද වූවන්ගේ හෝ භෙදය දැඩි කරන්නාහු වගීය කැමැති වූවාහු වගී වීමෙහි ඇලුණාහු වගී වීමට සතුටු වන්නාහු වගී කරන බස් කියන්නාහු වෙත්. මේ 'පෙසුඤ්ඤ'යි කියනු ලැබෙයි.

- නන්දිය නැතිවීමට විපරිණාම දුක්ඛතාවය දත යුතුය.
- නන්දිය ඇති වන්නේ අනුසය ධර්මයන් නිසාය. කලින් රස විඳ ඇති බව, එම පාරේ ගිය බව නිසා ඇතිවන දෙයකි.

- **අනුසය කෙසේ නැතිවන්නේද?**
- සැකය හරහා අනුසය ඇතිවේ.
- අවිද්‍යාව නැති කිරීමෙන් අනුසය නැතිවේ.

- විපල්ලාස 12 අවිද්‍යාවට ආසන්න කාරණය වේ.
- අවිද්‍යාව තණ්හාව නිසා ඇතිවේ.
- තණ්හාවත් අවිද්‍යාවත් දෙකම නැති කිරීමෙන් අනුසය නැතිවේ.



ඡන්දානිදානානි පියානි ලොකෙ, යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ;
ආසා ච නිට්ඨා ච ඉතොනිදානා, යෙ සම්පරායාය නරස්ස හොන්ති.

Desires are the cause of things dear in the world, along with the greed that go about in the world. And it too is the cause of the hopes & fulfillments for the sake of a person's next life.

ලොවැ ප්‍රියවස්තූහු කාමච්ඡන්දය නිදාන කොට ඇත්තාහුය, තවද ලොවැ යම් කෙනෙක් ලෝභය හේතු කොට හැසිරෙත් ද, (ඔවුන්ගේ ඒ ලෝභයත් කාමච්ඡන්දය හේතු කොට ඇත්තේය,) ආශාව ත් ආශා සමෘද්ධියත් මේ කාමච්ඡන්දය ම නිදාන කොට ඇත්තාහු ය, යම් ධර්ම කෙනෙක් සත්ත්වයා හට පරලොව පිහිට පිණිස වෙත් නම්, (ඔහු ද කාමච්ඡන්දයෙන් ම උපන්නාහු යි.)

**ඡන්දනිදානානි පියානි ලොකෙ** – 'ඡන්ද' නම්: කාමවස්තූන් කෙරෙහි යම් කාමච්ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණාවෙක් කාමස්නේහයෙක් කාමපරිදාහයෙක් කාමමූර්ඡාවෙක් කාමයන්හි ගැලීමෙක් කාමෞඝයෙක් කාමයෝගයෙක් කාමෝපාදානයෙක් කාමච්ඡන්දනීවරණයෙක් වේ ද, එයයි; තවද ඡන්ද පසෙකි: පර්යේෂණ (=සෙවීම) ඡන්දය, ප්‍රතිලාභච්ඡන්දය, පරිභොගච්ඡන්දය, සන්නිධි (=රැස්කිරීම) ඡන්දය, විසර්ජන (=වියදම් කිරීම) ඡන්දය දැයි;

**යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ** – 'යෙ චාපි' යනු: ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ගැහැවියෝ ද පැවිද්දෝ ද දෙවියෝ ද මිනිස්හු ද; **ලොභා** – යම් ලෝභයෙක් ලෝභාකාරයෙක් ලෝභ කරන බවෙක් ඇලීමෙක් ඇලෙන අයුරෙක් ඇලුණු බවෙක් අභිධ්‍යාවෙක් ලෝභ අකුශලමූලයෙක් වේ ද එයයි. **විචරන්ති** – හැසිරෙති වෙසෙති ඉරියව් පවත්වති, වැටෙති රැකෙති යැපෙති යාපනය වෙත්; **ලොකෙ** – අපායලෝකයෙහි.... ආයතනලෝකයෙහි නූයි 'යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ' යනු වේ.

**ආසා ච නිට්ඨා ච ඉතොනිදානා** – 'ආසා'යි තෘෂ්ණාව කියනු ලැබේ. යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවෙක් ලෝභ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද එයයි; **නිට්ඨා** – මෙලොවැ එකෙක් රූපයන් සොයනුයේ රූපය ලබයි, රූපසමෘද්ධිය ඇත්තේ වෙයි, ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යයන් – කුලය – ගණයා – ආවාසය – ලාභය යශස් – ප්‍රශංසාව – සුඛය – චීවර–


නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය සොයනුයේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ලබයි, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති සමෘද්ධිය ඇත්තේ වේ.

1. ආශාව හේතු කොට (ගොවියා) කෙත සායි, ආශාව හේතු කොට කිජුවට වපුරනු ලැබෙයි, ධනය රැස්කර ගන්නා වූ වෙළෙන්දෝ ආශාව හේතු කොට (නැවින්) මුහුදට යෙති, යම් ආශාවකින් මම මෙහි සිටිම් නම්, ඒ මාගේ ආශාව සමෘද්ධ වේවා'යි.

ආශාසමෘද්ධිය 'නිට්ඨා, (ඵලනිෂ්පත්ති) යයි කියනු ලැබේ. **ආසා ච නිට්ඨා ච ඉතොනිදානා** – ආශාවත් නිෂ්ඨාව (=සමෘද්ධිය) ත් මේ (රූපඡන්දාදි) ඡන්දය නිදාන කොට ඇත්තාහුය, ඡන්දය උත්පත්ති කොට – ඡන්දය ජාති කොට – ඡන්දය ප්‍රභව කොට ඇත්තාහු නූයි 'ආසා ච නිට්ඨා ච ඉතොනිදානා' යනු වේ.


**යෙ සම්පරායාය නරස්ස හොන්ති** – යම් ධර්ම කෙනෙක් සත්ත්වයා හට පරායණ වෙත් ද, ප්‍රතිෂ්ඨා වෙත් ද, ත්‍රාණ වෙත් ද, රක්ෂාස්ථාන වෙත් ද, සරණ වෙත් ද, මිනිසා ඒ ආශාසමෘද්ධිය පරායණ කොට ඇත් නූයි 'යෙ සම්පරායාය නරස්ස හොන්ති' යනු වේ.


- සුඛ වේදනීය වූ ස්පර්ශයෙන් ලෝභය ඇතිවේ.
- ඇස නිසාද, රූපය නිසාද, චක්ඛු විඤ්ඤාණය උපදී. ඒ තුන එක්වීමෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශය පැවැත්වීමට නම්, එම තුන් ධර්මයෝ පෙර මෙන්ම තිබිය යුතුය, විපරිණාම නොවිය යුතුය. මෙසේම, කණ, නාසය ආදී ඉන්ද්‍රියන් ගැනද මෙනෙහි කරන්න. ඇස වෙනස් වන්නේය, රූපයද වෙනස් වන්නේය, චක්ඛු විඤ්ඤාණයද වෙනස් වන්නේය. එසේ නම්, ස්පර්ශය පවතී යැයි විශ්වාස කළ නොහැක.




- ස්පර්ශය නිසා සුභ සංඥාව ඇතිවේ. ස්පර්ශය පවතී යැයි විශ්වාස කළ නොහැකි නම් සුභ යැයි විශ්වාස කළ නොහැක.
- සුඛය ඇතිවන්නේ සුභයට නිත්‍ය එකතු කිරීමෙනි. සුභ යැයි විශ්වාස කළ නොහැකි නම් එය භාවිතාකොට රාග සල්ලයෙන් කරකවා සාදාගන්නාවූ නිත්‍ය භාවයේ පැවැත්මක් නැත. ජාතියේ සිට ජරාවට යන බව දන්නා පුද්ගලයාට මෙය පැවැත්විය නොහැකි බව වැටහේ. එසේනම්, සුඛය පවතී යැයි විශ්වාස කළ නොහැක.

- වේදනාවට සංඥාව මගින් අගයක් දී තණ්හාව ඇතිවේ.
- සුභය නිත්‍යවී සෑදෙන සංඥාව සුඛ විය. එසේනම්, සුඛ සංඥාව පවතී යැයි විශ්වාස කළ නොහැක.
- සුඛ සංඥාව පරාමාස ගතවී අත්තා සෑදීන. එසේනම්, අත්තා යන්න පවතී යැයි විශ්වාස කළ නොහැක. අත්තා යන්න විශ්වාස කළ නොහැකි නම් දිට්ඨි අනුසය, අත්තානු දිට්ඨිය විශ්වාස කළ නොහැක.
- මෙම දිට්ඨීන් රූප, වේදනා, සංඥා පවතී යැයි විශ්වාස කිරීමෙන් ඇතිවිය.




දිට්ඨි අනුසය හරහා ඇතිවූ වේදනාව විශ්වාස කළ නොහැක. සාරාංශ වශයෙන්;
- කබලිකාරාහාරය සුභ යැයි විශ්වාස කළ නොහැක.
- රාග සල්ලයෙන් කරකැවීම මගින් ඇතිවූ වේදනාව විශ්වාස කළ නොහැක. එනම්, සාත යැයි විශ්වාස කළ නොහැක. සාත යැයි විශ්වාස කිරීමෙන් ක්‍රෝධය, මුසාව සහ සැකය ඇතිවේ.

විස්සාසපරමා ඤාතී - විශ්වාසය පරම ඤාතියාය. (The trusty are the best relative)

- පරම ඤාතියා වශයෙන් කුමක් විශ්වාස කරන ලද්දේද? රූප, වේදනා සහ සංඥා ය.
- මේවා පවතී යැයි සිතා විශ්වාස කරන ලදී.
- රූප සහ වේදනා දෙකෙළවර විශ්වාස කළ නොහැකි නම්, ස්පර්ශය විශ්වාස කළ නොහැක.
- ස්පර්ශය නිසා හටගන්නාවූ ධර්මයෝ විශ්වාස කළ නොහැක.

ඨිතස්ස අඤ්ඤථත්තං සඞ්ඛතලක්ඛණං - පවතින දේ වෙනස් වන්නේය.

- ඤාතියා වශයෙන් ගත් දේ වෙනස් වන්නේය. ඤාතියා සාදා ගත්තේ රූප විශ්වාස කරගෙනය. ජාරාවට පත්වන රූපයක් බැවින් සාදා ගත් ඤාතියා වෙනස් වන්නේය.
- එනම් විපරිණාම දුක්ඛතාවය ඇති සත්වයා දැන් දුක්ඛ දුක්ඛතාවයට යන්නේය.

අත්තා විශ්වාස කළ නොහැක.

- එය සෑදී ඇති මමංකාරය සහ අහංකාරය විශ්වාස කළ නොහැක.

පුත්තා මත්ථි ධනම්මත්ථි ඉති බාලො විහඤ්ඤති;

අත්තා හි අත්තනො නත්ථි, කුතො පුත්තා කුතො ධනං.

අත්තා හි අත්තනො නත්ථි – තෙමේද තමාට නැත - He himself not his own

- මෙහිදී 4 වන ධ්‍යාන සමාපත්තිය ඇතිවේ (catutthajjhānasamāpatti).

සාතං අසාතන්ති යමාහු ලොකෙ, තමූපනිස්සාය පහොති ඡන්දො;
රූපෙසු දිස්වා විභවං භවඤ්ච, විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ.

මේ ලොවැ සුව යැයි ද දුකැයි ද යමක් කියත් නම්, ඒ සාතාසාත වේදනාව නිසා ඡන්දය උපදී, ලොවැ සත්ත්ව තෙමේ භූතොපාදායරූපයන්හි විනාශය ත් උත්පත්තිය ත් දැක තෘෂ්ණා – දෘෂ්ටිවිනිශ්චය කරන්නේ යි.

**සාතං අසාතන්ති යමාහු ලොකෙ** – 'සාත' නම්, සුඛවේදනාව හා ඉෂ්ටවස්තුව යැ: **අසාත** – නම්: දුඃඛවේදනාව හා අනිෂ්ටවස්තුව යැ; **යමාහු ලොකෙ** – යමක් පවසත් නම්, යමක් කියත් නම් යමක් බෙණෙත් නම් යමක් දක්වත් නම් යමක් වහරත් නම් නුයි 'සාතං අසාතන්ති යමාහු ලොකෙ' යනු වේ.

**තමූපනිස්සාය පහොති ඡන්දො** – සාතාසාත (වේදනාව හා වස්තුව) නිසා සැපදුක් නිසා සොම්නස් දොම්නස් නිසා ඉටුඅනිටු නිසා අනුනය ප්‍රතිඝ නිසා ඡන්දය වෙයි පහළ වෙයි උපදී හටගනී නිපදී වෙසෙසින් නිපදී නුයි 'තමූපනිස්සාය පහොති ඡන්දො' යනු වේ.

**රූපෙසු දිස්වා විභවං භවඤ්ච** – 'රූපෙසු' යනු: සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා උපදනා රූපය ද වේ; රූපයන්ගේ භවය කවරැ යත්? රූපයන් ගේ යම් භවයෙක් ජාතියෙක් හටගැනීමෙක් නිපැදී-මෙක් වෙසෙසින් නිපැදීමෙක් පහළ වීමෙක් වේ ද, මේ රූපයන්ගේ භවයයි; රූපයන්ගේ විභවය කවරැ යත්? රූපයන්ගේ යම් ක්‍ෂයවීමෙක් වැනැසීමෙක් භේදයෙක් පරිභේදයෙක් අනිත්‍ය බවෙක් අතුරුදහන් වීමෙක් වේ ද, මේ රූපයන් ගේ විභව යයි. **රූපෙසු දිස්වා විභවං භවඤ්ච** – රූපයන්හි හටගැනීම් ද වැනැසීම ද දැක බලා තුලනය කොට තීරණය කොට සලකා ප්‍රකට කොට නුයි 'රූපෙසු දිස්වා විභවං භවඤ්ච' යනු වේ.

What they call 'appealing' & 'unappealing' in the world: in dependence on that desire arises. Having seen existence & non-existence with regard to forms, a person gives rise to decisions in the world;


**විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ** – 'විනිච්ඡය' නම්: තෘෂ්ණා-විනිශ්චය ද දෘෂ්ටිවිනිශ්චය දැයි විනිශ්චය දෙකෙකි: කෙසේ තෘෂ්ණාවිනිශ්චය කෙරෙයි යත්? මෙහි එකක් හට නූපන් භොගයෝ ත් නූපදිති, උපන් භොගයෝ ත් ක්‍ෂය වීමට යෙති; ඔහුට මෙසේ සිතෙක් වෙයි: 'කවර උපායයෙකින් මට නූපන් භොගයෝ ත් නූපදිත් ද, උපන් භොගයෝත් ක්‍ෂය වීමට යෙත් දැ'යි. යළි ඔහුට මෙසේ සිත් වෙයි: 'මදයට ප්‍රමාදයට කරුණු වූ රහමෙර පිමෙහි නැවත නැවත යෙදුණු මට නූපන් භොගයෝ ත් නූපදිති, උපන් භොගයෝ ත් පිරිහෙති: නො කල්හි වීථිසඤ්චාරයෙහි පුනපුනා යෙදුණු මට නූපන් භොගයෝ ත් නූපදිති, උපන් භොගයෝ ත් පිරිහීමට යෙති; නෘත්‍යාදිය දැකීම් වශයෙන් පිරිස්හි හැසිරීමෙහි පුනපුනා යෙදුණු මට – ප්‍රමාදයට කරුණු වූ ද්‍යූතයෙහි පුනපුනා යෙදුණු මට – පාපමිත්‍රානුයොගයෙහි පුනපුනා යෙදුණු මට – ආලස්‍යයෙන් යුක්ත බැවිහි පුනපුනා යෙදුණු මට නූපන් භොගයෝ ත් නූපදිති, උපන් භොගයෝ ත් පිරිහීමට යෙති' මෙසේ නුවණ උපදවා සවැදෑරුම් වූ භොගයන් ගේ විනාසයෙහි දොරටු සෙවනය නො කෙරෙයි, සවැදෑරුම් වූ භොගයන් ගේ ආයද්වාරයන් සෙවනය කෙරෙයි; මෙසේත් තෘෂ්ණා විනිශ්චය කෙරෙයි.

කථං දිට්ඨිවිනිච්ඡයං කරොති? චක්ඛුස්මිං උප්පන්නෙ ජානාති – "අත්තා මෙ උප්පන්නො"ති, චක්ඛුස්මිං අන්තරහිතෙ ජානාති – "අත්තා මෙ අන්තරහිතො විගතො මෙ අත්තා"ති. එවම්පි දිට්ඨිවිනිච්ඡයං කරොති. සොතස්මිං…ඝානස්මිං…ජිව්හාය…
**ජන්තූ**ති සත්තො නරො මානවො…පෙ…. මනුජො. **ලොකෙ**ති අපායලොකෙ …පෙ…. ආයතනලොකෙති.


පිටුව 6, 7 සහ 8 භාවනා කිරීම මගින් අපි දැන ගන්නවා;
a) සාත යැයි විශ්වාස කළ නොහැක (පිටුව 7)
b) අත්තා විශ්වාස කළ නොහැක. මමංකාරය සහ අහංකාරය විශ්වාස කළ නොහැක (පිටුව 8)
වෙනත් ආකාරයකට පැවසුවොත්, රූප, වේදනා, සංඥා, සංස්කාර සහ විඤ්ඤාණ පවතී යැයි විශ්වාස කළ නොහැක.

ත්‍රිකෝණ දෙක මෙනෙහි කරන්න.
- රූපය පවතී යැයි විශ්වාස කළ නොහැක. රූපය අනිත්‍යයි.
- වේදනාව පවතී යැයි විශ්වාස කළ නොහැක. වේදනාව අනිත්‍යයි.
- සඤ්ඤාව පවතී යැයි විශ්වාස කළ නොහැක. සඤ්ඤාව අනිත්‍යයි.
- සංස්කාර පවතී යැයි විශ්වාස කළ නොහැක. සංස්කාර අනිත්‍යයි.
- විඤ්ඤාණය පවතී යැයි විශ්වාස කළ නොහැක. විඤ්ඤාණය අනිත්‍යයි.
- මෙසේ සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය යැයි වැටහේ.

- කෙටියෙන්ම කියතොත් උපාදානස්කන්ධ පසම දුක් වන්නේය (සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා)
- මේ සියල්ල ධාතු නිසාය.




හයෙන් අගතියට යෑම




සටහන: පහළ ත්‍රිකෝණය භාවනා කිරීමෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ඇතිවේ (ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති). මේ සඳහා දුක්ඛ 12 අනුලෝම, ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කළ යුතුය.